AL/2016/33/S-I

62647

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்**
**General Certificate of Education (Adv. Level) Examination, August 2016**

| | |
|---|---|
| **ගිණුම්කරණය** | **I** |
| கணக்கீடு | **I** |
| Accounting | **I** |

**33 S I**

***පැය දෙකයි***
*இரண்டு மணித்தியாலம்*
*Two hours*

**උපදෙස්:**
* අංක **1** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා **එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**
* අංක **31** සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු **අදාළ තිත් ඉරි මත ලියන්න.**
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු **දෙක** බැගින් හිමි වේ.
* **විභාග අංකය**, ඉහළින් ඇති කොටුවේ පැහැදිලි ව සටහන් කරන්න.

**විභාග අංකය :** ..............................

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| **I පත්‍රය සඳහා** | |
|---|---|
| **ප්‍රශ්න අංකය** | **ලකුණු** |
| **01 - 30** | |
| **31 - 50** | |
| **එකතුව** | |

| | **අත්සන** | **සංකේත අංක** |
|---|---|---|
| 1 වන පරීක්ෂකගේ | | |
| 2 වන පරීක්ෂකගේ | | |
| අති/ප්‍රධාන පරීක්ෂකගේ | | |
| ගණිත පරීක්ෂකගේ | | |
| ප්‍රධාන පරීක්ෂකගේ | | |

**1.** පහත කුමන ප්‍රකාශයෙන් ආයතනයක ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ **වඩාත් හොඳින්** විස්තර කරනු ලබයි ද?
(1) ආයතනයක ගනුදෙනු මූලික පොත්වල සටහන් කිරීම
(2) ආයතනයක ගනුදෙනු මූල්‍ය වාර්තා පිළියෙල කිරීම සඳහා සටහන් කිරීම
(3) ආයතනයක මූල්‍ය වාර්තා ගිණුම්කරණ ප්‍රමිත පදනම්ව පිළියෙල කිරීම
(4) ආයතනය පිළිබඳ තොරතුරු කළමනාකරුවන්ගේ භාවිතය සඳහා සන්නිවේදනය කිරීම
(5) ආයතනයක් පිළිබඳ ඇල්මක් දක්වන පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා තොරතුරු සන්නිවේදනය කිරීම (......)

**2.** වත්කම්, ජංගම සහ ජංගම නොවන ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වර්ගීකරණය කිරීම සඳහා පහත කුමන ගිණුම්කරණ සංකල්පය පදනම් වන්නේ ද?
(1) උපචිත
(2) අඛණ්ඩ පැවැත්ම
(3) ඓතිහාසික පිරිවැය
(4) කාලච්ඡේද
(5) ආරක්ෂණ (......)

**3.** වසර අග තොගය, පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත හඳුනාගැනීම සඳහා පදනම් වන්නේ පහත කුමන ගිණුම්කරණ සංකල්පය ද?
(1) උපචිත (2) කාලච්ඡේද (3) යථාරූපී (4) උපලබ්ධි (5) ආරක්ෂණ (......)

**4.** ශ්‍රී ලංකාවේ අනුගමනය කරන 'මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට' අනුව මූල්‍ය තොරතුරුවල වැඩිදියුණු කිරීමේ ගුණාත්මක ගතිලක්ෂණයක් **නො වන්නේ** පහත දැ අතුරෙන් කුමක් ද?
(1) සංසන්දනාත්මක බව
(2) විශ්වසනීය නියෝජනය
(3) සත්‍යාපනය කළ හැකි බව
(4) කාලීන බව
(5) අවබෝධ කරගත හැකි බව (......)

**5.** පහත කුමන ප්‍රකාශය ආයතනයක ගිණුම්කරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් **නිවැරදි** වේ ද?
(1) සුළු මුදල් පොත ආයතනයක ලෙජර ගිණුමක් ලෙස ද භාවිත කෙරේ.
(2) සියලු මූලික ලියවිලි ආයතනයක ගණකාධිකාරිවරයා විසින් පිළියෙල කරනු ලබයි.
(3) ණය පදනම මත මිල දී ගත් සියලු වත්කම් සටහන් කිරීම සඳහා ගැනුම් ජර්නලය භාවිත කෙරේ.
(4) ආයතනයක ශේෂ පිරික්සුම තුලනය වීම එහි ගිණුම්කරණ ක්‍රියාවලියේ නිවැරදිතාව තහවුරු කරයි.
(5) භාණ්ඩ ණයට විකුණුම් හා බැඳි සාරාංශගත තොරතුරු ණයගැති පාලන ගිණුමේ සටහන් කරයි. (......)

**6.** පහත තොරතුරු සීමිත දයා පොදු සමාගමට අදාළ වේ.

| | **2016.03.31 දිනට (රු.)** | **2015.03.31 දිනට (රු.)** |
|---|---|---|
| ගෙවිය යුතු කුලී | – | 60 000 |
| ගෙවිය යුතු අලුත්වැඩියා වියදම් | 40 000 | 80 000 |

* 2014.04.01 දින සමාගම රු. 30 000 ක මාසික කුලියකට ගොඩනැගිල්ලක් කුලියට ගන්නා ලදී.
* 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගෙවූ, කුලී සහ අලුත්වැඩියා වියදම් පිළිවෙළින් රු. 480 000 ක් සහ රු. 380 000 ක් විය.

2016.03.31 දිනට කලින් ගෙවූ කුලී සහ 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අලුත්වැඩියා වියදම්:

| | **කලින් ගෙවූ කුලී (රු.)** | **අලුත්වැඩියා වියදම් (රු.)** |
|---|---|---|
| (1) | 60 000 | 340 000 |
| (2) | 60 000 | 420 000 |
| (3) | 120 000 | 340 000 |
| (4) | 480 000 | 420 000 |
| (5) | 480 000 | 300 000 |

(......)

[දෙවැනි පිටුව බලන්න.

7. 2016.03.31 දිනෙන් අවසන් මාසය සඳහා ආයතනයක් විසින් රු. 900 000 ක ශුද්ධ වැටුපක් ගෙවන ලදී. සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවක සහ සේවායාගේ දායකත්වයන් පිළිවෙළින් 10% ක් සහ 15% ක් වන අතර ඒවා 2016 මාර්තු මාසය සඳහා මෙතෙක් ගෙවා නොමැත. සේවකයන්ගේ වැටුපෙන් කරන එක ම අඩු කිරීම සේවක අර්ථසාධක අරමුදල් දායකය වේ. මෙම ගනුදෙනුවල **බලපෑම** ගිණුම්කරණ සමීකරණයේ දක්වනුයේ:

| | **වත්කම්** | **වගකීම්** | **හිමිකම්** |
|---|---|---|---|
| (1) | රු. 900 000 කින් අඩු වේ. | රු. 150 000 කින් වැඩි වේ. | රු. 1 050 000 කින් අඩු වේ. |
| (2) | රු. 900 000 කින් අඩු වේ. | රු. 100 000 කින් වැඩි වේ. | රු. 1 000 000 කින් අඩු වේ. |
| (3) | රු. 900 000 කින් අඩු වේ. | රු. 250 000 කින් වැඩි වේ. | රු. 1 150 000 කින් අඩු වේ. |
| (4) | රු. 1 000 000 කින් අඩු වේ. | රු. 150 000 කින් වැඩි වේ. | රු. 1 150 000 කින් අඩු වේ. |
| (5) | රු. 1 000 000 කින් අඩු වේ. | – | රු. 1 000 000 කින් අඩු වේ. |

(......)

8. 2016.03.31 දිනට සීමිත රේණු පොදු සමාගමේ ශේෂ පිරික්සුම තුලනය නොවූ අතර එම වෙනස අවිනිශ්චිත ගිණුමකට මාරු කරන ලදී. පසුව කරන ලද විමර්ශනයේ දී පහත දෑ හෙළිදරව් විය:

A - විදුලි වියදම් සඳහා ගෙවූ රු. 200 000 මුදල් ගිණුමෙහි පමණක් සටහන් කර තිබුණි.
B - ගැනුම් ජර්නලය රු. 60 000 ක් වැඩියෙන් එකතු කර තිබුණි.
C - ණයගැතියකුගෙන් ලද රු. 50 000 ක් මුදල් ගෙවීමක් ලෙස ණයහිමි පාලන ගිණුමෙහි සටහන් කර තිබුණි.
D - රු. 40 000 ක විකුණුම් ඉන්වොයිසියක් ණයගැති ලෙජරයේ පමණක් සටහන් කර තිබුණි.

ඉහත කුමන වැරදි අවිනිශ්චිත ගිණුමෙහි ශේෂයක් ඇති වීමට දායක වූයේ ද?

(1) A හා C පමණි. (2) B හා D පමණි. (3) A, B හා C පමණි.
(4) B, C හා D පමණි. (5) A, B, C හා D යන සියල්ලම. (......)

9. විවාහ මංගල උත්සව සඳහා ශාලාවක් කුලියට දීමේ නියුතු ව්‍යාපාර ආයතනයක 2016 අප්‍රේල් මාසය තුළ දී පහත ගනුදෙනු සිදු විය. මෙම ශාලාව රු. 400 000 කට කුලියට දෙනු ලබන අතර ඉන් 25% ක් ශාලාව වෙන් කරන අවස්ථාවේ දී ද, ඉතිරිය විවාහ මංගල උත්සවයෙන් පසුව සතියක් ඇතුළත ද ගෙවිය යුතු වේ.

| **දිනය** | **ගනුදෙනුව** | **වටිනාකම (රු.)** |
|---|---|---|
| 2016.04.02 | 2016.03.28 දින පැවති විවාහ උත්සවය සඳහා ලද ඉතිරි මුදල | 300 000 |
| 2016.04.05 | 2016.04.27 දින පැවැත්වීමට නියමිත විවාහ උත්සවය සඳහා ලද අත්තිකාරම | 100 000 |
| 2016.04.15 | 2016.05.10 දින පැවැත්වීමට නියමිත විවාහ උත්සවය සඳහා ලද අත්තිකාරම | 100 000 |
| 2016.04.30 | 2016 අප්‍රේල් මාසය සඳහා දරන ලද මෙහෙයුම් වියදම් | 330 000 |

2016 අප්‍රේල් මාසය සඳහා ආදායම හා ලාභය/(අලාභය) සහ 2016.04.30 දිනට ලැබිය යුතු දෑ කොපමණ ද?

| | **ආදායම (රු.)** | **ලාභය/(අලාභය) (රු.)** | **ලැබිය යුතු දෑ (රු.)** |
|---|---|---|---|
| (1) | 200 000 | (130 000) | 600 000 |
| (2) | 400 000 | 70 000 | 300 000 |
| (3) | 500 000 | 170 000 | 600 000 |
| (4) | 700 000 | 370 000 | 300 000 |
| (5) | 800 000 | 470 000 | 600 000 |

More Past Papers at
tamilguru.lk

(......)

- **ප්‍රශ්න අංක 10 සහ 11 ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පාසලක ආදි ශිෂ්‍ය සංගමයකට අදාළ තොරතුරු පහත දැක්වේ.

| **විස්තරය** | **වටිනාකම (රු.'000)** |
|---|---|
| සාමාජික මුදල් ලැබීම් (මෙයින් 1/4 ක්, 2015.03.31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ වේ.) | 360 |
| ක්‍රීඩා උපකරණ මිල දී ගැනීම සඳහා ලද පරිත්‍යාග | 500 |
| ස්ථාවර තැන්පතුව මත උපයන ලද පොලී ආදායම | 50 |
| මුළු වියදම් | 300 |

**අතිරේක තොරතුරු:**

- සාමාජිකයකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 4 000 කි. 2016.03.31 දිනට සංගමයේ සාමාජිකයන් 100 ක් විය.
- පරිත්‍යාග, ලද වර්ෂයෙන් ආරම්භ වී වර්ෂ 5 ක කාලයක් තුළ දී, ආදායම ලෙස හඳුනාගැනීම සංගමයේ ප්‍රතිපත්තිය වේ.
- ස්ථාවර තැන්පතුව මත පොලී 2016.05.31 දින එය කල්පිරීමේ දී ලැබෙනු ඇත.
- සියලු වියදම් මුදලින් ගෙවා ඇත.
- 2015.03.31 දිනට මුදල් ශේෂය රු. 150 000 කි.

10. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අතිරික්තය කොපමණ ද?
(1) රු. 120 000 (2) රු. 210 000 (3) රු. 250 000 (4) රු. 520 000 (5) රු. 650 000 (......)

11. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ශේෂයේ **ශුද්ධ වැඩිවීම** කොපමණ ද?
(1) රු. 470 000 (2) රු. 520 000 (3) රු. 560 000 (4) රු. 610 000 (5) රු. 860 000 (......)

12. එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි ව්‍යාපාරයක් වන සීමිත අජිත් පොදු සමාගම 2015.04.01 දින රු. 4 140 000 කට යන්ත්‍රයක් මිල දී ගන්නා ලදී. මෙහි VAT සඳහා ගෙවූ රු. 540 000 ක් අඩංගු වේ. මෙම යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය වර්ෂ 5 ක් වන අතර එයට සුන්බුන් අගයක් නොමැත.

LKAS 16 (දේපළ, පිරියත සහ උපකරණ) ප්‍රමිතයට අනුව 2016.03.31 දිනට යන්ත්‍රයේ ධාරණ වටිනාකම කොපමණ ද?
(1) රු. 2 448 000 (2) රු. 2 880 000 (3) රු. 3 312 000 (4) රු. 3 600 000 (5) රු. 4 140 000 (......)

**13.** හවුල් ව්‍යාපාරයකට අදාළ ව පහත කුමන ප්‍රකාශය **නිවැරදි** වේ ද?
(1) හවුල් ව්‍යාපාරයක හිමිකම නිරූපණය කරනු ලබන්නේ හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන සහ ජංගම ගිණුම් ශේෂයන් සහ වෙනත් සංචිත ඇත්නම් ඒවායේ ද එකතුවෙනි.
(2) 1890 හවුල් ව්‍යාපාර ආඥාපනතෙහි 24 වන වගන්තියට අනුව හවුල්කරුවකු වේතනයකට හිමිකම් ලබනුයේ හවුල් ව්‍යාපාරයට යම් සේවාවක් සැපයූ විට පමණි.
(3) 1890 හවුල් ව්‍යාපාර ආඥාපනතෙහි 24 වන වගන්තියට අනුව හවුල්කරුවන් අතර ලාභාලාභ බෙදාහරිනු ලබන්නේ ඔවුන් හවුල් ව්‍යාපාරයේ ප්‍රාග්ධනයට දායක වී ඇති අනුපාතයට ය.
(4) හවුල් ව්‍යාපාරයක කීර්තිනාමය ඇස්තමේන්තු කරනු ලබන්නේ හවුල්කරුවකු ඇතුළත් වූ විට දී හෝ විශ්‍රාම ගිය විට දී පමණි.
(5) හවුල්කරුවකු ඇතුළත් කරගත හැකි වන්නේ හෝ විශ්‍රාම යා හැකි වන්නේ මූල්‍ය වර්ෂයක පළමුවන හෝ අවසාන දිනයේ දී පමණි. (......)

**14.** LKAS 2 (තොග) ප්‍රමිතයේ නිර්වචනයට අනුව තොග ලෙස හඳුනාගත හැකි වන්නේ පහත දෑ අතුරෙන් කුමක් ද?
A - සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල දී විකිණීම සඳහා පවත්වා ගනු ලබන භාණ්ඩ
B - සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල දී විකිණීම සඳහා නිෂ්පාදනය වෙමින් පවතින අයිතම
C - නිෂ්පාදන ක්‍රියාවලියේ දී හෝ සේවා සැපයීමේ දී භාවිත කිරීමට ඇති ද්‍රව්‍ය සහ සැපයුම්

(1) A පමණි. (2) A හා B පමණි. (3) A හා C පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C යන සියල්ලම. (......)

**15.** පහත තොරතුරු සීමිත රබිත පොදු සමාගමේ මෝටර් රථ හා බැඳේ.

| **විස්තරය** | **රු.'000** |
|---|---|
| 2015.04.01 දිනට ධාරණ වටිනාකම | 6 500 |
| 2015.09.30 දින විකුණූ මෝටර් රථය මත ඇති වූ අලාභය | 150 |
| 2016.01.01 දින නව මෝටර් රථයක් අත්පත් කර ගැනීම | 4 000 |

වර්ෂය ආරම්භයේ දී පැවති සියලු මෝටර් රථ 2010.04.01 දින මිල දී ගෙන ඇත. වර්ෂය තුළ දී විකුණූ මෝටර් රථය රු. 3 000 000 ක පිරිවැයකට මිල දී ගෙන ඇත. මෝටර් රථ වාර්ෂිකව 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.
2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෝටර් රථ ක්ෂය සහ විකුණන ලද මෝටර් රථයේ විකුණුම් වටිනාකම වනුයේ:

| | **ක්ෂය (රු.'000)** | **විකුණුම් වටිනාකම (රු.'000)** |
|---|---|---|
| (1) | 650 | 1 500 |
| (2) | 1 000 | 1 350 |
| (3) | 1 100 | 1 350 |
| (4) | 1 100 | 1 200 |
| (5) | 1 250 | 1 200 |

(......)

**16.** 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත මානෙල් පොදු සමාගමේ සාරාංශගත ආදායම් ප්‍රකාශනය පහත පරිදි වේ:

| **විස්තරය** | **රු.'000** |
|---|---|
| දළ ලාභය | 280 |
| වියදම් (රු. 20 000 ක ක්ෂය සහ රු. 10 000 ක කාර්යාලීය උපකරණ විකුණුම් මත අලාභය ද ඇතුළු ව) | 100 |
| ආදායම් බදු වියදම | 80 |
| වර්ෂය සඳහා ලාභය | 100 |

2016.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී පහත අයිතමයන්ගේ ශේෂයන් පහත පරිදි **වැඩි වී** ඇත:

| **විස්තරය** | **රු.'000** |
|---|---|
| තොගය | 80 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 120 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 130 |

වර්ෂය තුළ දී ගෙවූ ආදායම් බදු රු. 50 000 කි.
LKAS 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශනය) ප්‍රමිතයට අනුව 2016.03.31 දිනෙන් අවසන් වර්ෂයේ දී මෙහෙයුම් කටයුතු තුළින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය කොපමණ ද?
(1) රු. 10 000 (2) රු. 90 000 (3) රු. 150 000 (4) රු. 180 000 (5) රු. 230 000 (......)

**17.** සීමිත ඉසුරු පොදු සමාගමේ 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන, අධ්‍යක්ෂකවරු විසින් 2016.06.15 දින අනුමත කරන ලදී. 2016.03.31 දින සිට 2016.06.15 දක්වා කාලයේ දී පහත සිද්ධීන් සමාගමේ සිදු විය.
A - 2016.04.15 දින සිට ව්‍යාපාරයේ කොටසක් වසා දැමීමේ සැලැස්මක් නිවේදනය කරන ලද අතර, මෙමගින් වාර්ෂිකව රු. 600 000 ක් ඉතිරි කිරීමට අපේක්ෂා කෙරේ.
B - රු. 1 000 000 ක අලාභයක් ජනනය කරමින් 2016.04.20 දින ප්‍රධාන නිෂ්පාදන පිරියතයක් ගින්නකින් විනාශ විය.
C - 2016.04.30 දින සිදු කළ ණයට විකුණුම් නිසා ඇති වූ රු. 750 000 ක ශේෂයක් සහිත ණයගැතියකු 2016.05.30 දින බුන්වත් විය.
D - 2016.06.15 දින සාමාන්‍ය කොටස්හිමියන්ට රු. 300 000 ක අවසාන ලාභාංශයක් ප්‍රකාශයට පත් කිරීම.

LKAS 10 (වාර්තා කරන කාලච්ඡේදයට පසු සිදුවීම්) ප්‍රමිතයට අනුව 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉහත කුමන සිදුවීම් **නොගළපන සිද්ධීන්** ලෙස සලකනු ලබයි ද?
(1) A හා B පමණි. (2) B හා C පමණි. (3) A, C හා D පමණි.
(4) B, C හා D පමණි. (5) A, B, C හා D යන සියල්ලම. (......)

[හතරවැනි පිටුව බලන්න.

- **ප්‍රශ්න අංක 18, 19 සහ 20 ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සීමිත නාමල් පොදු සමාගමට අදාළ වේ:

| **විස්තරය** | **රු.'000** |
|---|---|
| විකුණුම් | 1 200 |
| විකුණුම් පිරිවැය | 600 |
| මෙහෙයුම් වියදම් | 300 |
| මෝටර් රථයක් විකිණීම මත ලාභය | 80 |
| සාමාන්‍ය කොටස්හිමියන්ට ගෙවූ අතුරු ලාභාංශ | 100 |
| ප්‍රත්‍යාගණන හිඟය - කාර්යාලීය උපකරණ | 120 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය - ගොඩනැගිලි | 180 |

2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්යාලීය උපකරණ ප්‍රත්‍යාගණනය මත රු. 90 000 ක අතිරික්තයක් හඳුනාගෙන තිබුණි. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී ප්‍රථම වතාවට ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කර ඇත.

**18.** ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනා ගන්නා ලද මුළු ආදායම සහ මුළු වියදම කොපමණ ද?

| | **මුළු ආදායම (රු.'000)** | **මුළු වියදම (රු.'000)** |
|---|---|---|
| (1) | 1 280 | 900 |
| (2) | 1 340 | 900 |
| (3) | 1 380 | 1 020 |
| (4) | 1 460 | 1 020 |
| (5) | 1 460 | 1 120 |

More Past Papers at
tamilguru.lk

(......)

**19.** LKAS 1 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතයට අනුව 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගන්නා ලද ලාභය සහ වෙනත් විස්තීරණ ආදායම කොපමණ ද?

| | **ලාභය (රු.'000)** | **වෙනත් විස්තීරණ ආදායම (රු.'000)** |
|---|---|---|
| (1) | 160 | 180 |
| (2) | 250 | 90 |
| (3) | 260 | 180 |
| (4) | 350 | 90 |
| (5) | 380 | 60 |

(......)

**20.** LKAS 1 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතයට අනුව 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම සහ රඳවාගත් ඉපැයුම් කොපමණ ද?

| | **මුළු විස්තීරණ ආදායම (රු.'000)** | **රඳවාගත් ඉපැයුම් (රු.'000)** |
|---|---|---|
| (1) | 340 | 160 |
| (2) | 340 | 250 |
| (3) | 440 | 250 |
| (4) | 440 | 260 |
| (5) | 440 | 280 |

(......)

**21.** වෙළෙඳ සමාගමක දළ ලාභ අනුපාතය ස්ථාවරව තිබිය දී, පසුගිය වර්ෂය හා සැසඳීමේ දී ප්‍රවර්තන වර්ෂයේ ශුද්ධ ලාභ අනුපාතය **අඩුවීමට** පහත කුමන ද බලපානු ලබයි ද?

A - ප්‍රවර්තන වර්ෂයේ අවසාන තොගයේ ශුද්ධ උපලබ්ධි අගය එහි පිරිවැයට වඩා අඩු වීම
B - පොලී ආදායම අඩු වීම
C - ගොඩනැගිලි ප්‍රථම වරට හිඟයකට ප්‍රත්‍යාගණනය කිරීම
D - සාමාන්‍ය කොටස්හිමියන්ට අතුරු ලාභාංශයක් ගෙවීම

(1) A හා B පමණි. (2) B හා C පමණි. (3) A, B හා C පමණි.
(4) A, B හා D පමණි. (5) A, B, C හා D යන සියල්ලම. (......)

**22.** 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමක ආදායම් ප්‍රකාශනයෙන් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

| | | |
|---|---|---|
| විකුණුම් | රු. | 4 000 000 |
| වර්ෂයේ ලාභය | රු. | 200 000 |
| පොලී වියදම් | රු. | 60 000 |
| ආදායම් බදු වියදම | රු. | 40 000 |

2016.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ශුද්ධ ලාභ අනුපාතය සහ පොලී ආවරණ අනුපාතය කොපමණ ද?

| | **ශුද්ධ ලාභ අනුපාතය (%)** | **පොලී ආවරණ අනුපාතය (වාර)** |
|---|---|---|
| (1) | 5 | 3.3 |
| (2) | 5 | 5 |
| (3) | 6 | 4 |
| (4) | 6 | 5 |
| (5) | 7.5 | 4 |

(......)

**23.** පිරිවැය වර්ගීකරණයට අදාළ ව පහත කුමන ප්‍රකාශය **නිවැරදි** වේ ද?
(1) නිෂ්පාදිත පිරිවැය සමන්විත වන්නේ සෘජු පිරිවැයෙන් පමණි.
(2) සියලු සෘජු පිරිවැය, විචල්‍ය පිරිවැය වේ.
(3) යන්ත්‍ර ක්ෂය පාලනය කළ හැකි පිරිවැයක් ලෙස සලකනු ලබයි.
(4) පිරිවැය, හැසිරීම මත ප්‍රධාන වශයෙන් විචල්‍ය සහ ස්ථාවර ලෙස වර්ග කරනු ලැබේ.
(5) තොග මැනීම සඳහා පිරිවැය, අදාළ සහ අදාළ නොවන ලෙස වර්ග කරනු ලැබේ. (……)

- **ප්‍රශ්න අංක 24 සහ 25 ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

සමාගමක් භාණ්ඩ නිෂ්පාදනය සඳහා 'A' අමුද්‍රව්‍ය යොදා ගනී. මෙම අමුද්‍රව්‍යයේ ඇණවුමක පිරිවැය රු. 250 ක් වන අතර එහි වාර්ෂික රඳවා ගැනීමේ පිරිවැය ඒකකයකට රු. 100 කි. 'A' අමුද්‍රව්‍යයෙහි යළි ඇණවුම් ප්‍රමාණය තීරණය කිරීම සඳහා සමාගම ආර්ථික ඇණවුම් ප්‍රමාණ (EOQ) ආකෘතිය භාවිත කරයි. පහත තොරතුරු 'A' අමුද්‍රව්‍යයට අදාළ වේ:

| | | |
|---|---|---|
| උපරිම පරිභෝජනය | සතියකට ඒකක | 750 |
| අවම පරිභෝජනය | සතියකට ඒකක | 250 |
| ආර්ථික ඇණවුම් ප්‍රමාණය | ඒකක | 1 000 |
| පොරොත්තු කාලය | සති | 3 (අවම) – 5 (උපරිම) |

**24.** 'A' අමුද්‍රව්‍යයෙහි උපරිම තොග මට්ටම කොපමණ ද?
(1) ඒකක 1 750 (2) ඒකක 2 750 (3) ඒකක 3 500 (4) ඒකක 3 750 (5) ඒකක 4 000 (……)

**25.** 'A' අමුද්‍රව්‍යයෙහි වාර්ෂික ඉල්ලුම කොපමණ ද?
(1) ඒකක 200 000 (2) ඒකක 400 000 (3) ඒකක 500 000 (4) ඒකක 1 250 000 (5) ඒකක 2 500 000 (……)

- **ප්‍රශ්න අංක 26 සහ 27 ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

යන්ත්‍ර සහ නිමැවුම් ලෙස නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් සහ සේවා දෙපාර්තමේන්තුවක් වන ගබඩාවකින් සමන්විත සමාගමකට පහත තොරතුරු අදාළ වේ.

| **විස්තරය** | **යන්ත්‍ර** | **නිමැවුම්** | **ගබඩාව** |
|---|---|---|---|
| අයවැයගත පොදු කාර්ය පිරිවැය | රු. 175 000 | රු. 125 000 | රු. 50 000 |
| පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත | යන්ත්‍ර පැයකට රු. 20 | ශ්‍රම පැයකට රු. 10 | – |

ගබඩාවේ මුළු පොදු කාර්ය පිරිවැය, නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙක අතරේ සමානව නැවත විභජනය කෙරේ. සමාගම නිපදවනු ලබන 'X' භාණ්ඩයේ ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා යන්ත්‍ර පැය 2 ක් සහ ශ්‍රම පැය 5 ක් අවශ්‍ය වේ.

**26.** යන්ත්‍ර සහ නිමැවුම් දෙපාර්තමේන්තුවල භාවිත කිරීමට අපේක්ෂිත යන්ත්‍ර පැය සහ ශ්‍රම පැය පිළිවෙළින් කොපමණ ද?

| | **යන්ත්‍ර පැය** | **ශ්‍රම පැය** |
|---|---|---|
| (1) | 8 750 | 12 500 |
| (2) | 10 000 | 15 000 |
| (3) | 10 000 | 10 000 |
| (4) | 17 500 | 6 250 |
| (5) | 20 000 | 7 500 |

More Past Papers at
tamilguru.lk

(……)

**27.** 'X' භාණ්ඩයේ ඇස්තමේන්තුගත ප්‍රාථමික පිරිවැය රු. 120 ක් නම්, එහි ඒකකයක නිෂ්පාදන පිරිවැය කොපමණ ද?
(1) රු. 140 (2) රු. 150 (3) රු. 160 (4) රු. 170 (5) රු. 210 (……)

**28.** පිරිවැය-පරිමා-ලාභ (CVP) විශ්ලේෂණය සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශ **සත්‍ය** වේ ද?
A - සමච්ඡේදන ලක්ෂ්‍යයට පසුව උපයන ලද දායකය ලාභයක් ජනනය කරයි.
B - සමච්ඡේදන ලක්ෂ්‍යයේ දී මුළු දායකය මුළු ස්ථාවර පිරිවැයට සමාන වේ.
C - සමච්ඡේදන ලක්ෂ්‍යයෙන් පසුව මුළු දායකය, මුළු ස්ථාවර පිරිවැය හා ලාභයේ එකතුවට සමාන වේ.
D - සමච්ඡේදන ලක්ෂ්‍යයට පෙර ස්ථාවර පිරිවැය මුළු දායකයට වඩා වැඩි වේ.
(1) A හා B පමණි. (2) B හා C පමණි. (3) A, C හා D පමණි.
(4) B, C හා D පමණි. (5) A, B, C හා D යන සියල්ලම. (……)

**29.** සමාගමක් තනි භාණ්ඩයක් නිෂ්පාදනය කරනු ලබයි. මෙම භාණ්ඩයේ ඒකකයක නිෂ්පාදන පිරිවැය රු. 200 ක් වන අතර ඉන් 75%ක් විචල්‍ය වේ. සමාගම වර්තමානයේ දී ඒකක 14 000 ක් නිෂ්පාදනය කරන අතර එහි දායක විකුණුම් අනුපාතය 50% කි. වර්තමාන ක්‍රියාකාරී මට්ටම ඒකක 16 000 දක්වා වැඩි වූ විට රු. 260 000 ක අතිරේක ස්ථාවර නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයක් දැරීමට සමාගමට සිදු වේ.
වර්තමාන ක්‍රියාකාරී මට්ටමේ දී සමච්ඡේදන ලක්ෂ්‍යය (රුපියල්වලින්) සහ ක්‍රියාකාරී මට්ටම ඒකක 16 000 දී ඒකකයක නිෂ්පාදන පිරිවැය:

| | **සමච්ඡේදන ලක්ෂ්‍යය (රු.'000)** | **ඒකකයක නිෂ්පාදන පිරිවැය (රු.)** |
|---|---|---|
| (1) | 1 400 | 200.00 |
| (2) | 1 400 | 210.00 |
| (3) | 1 400 | 216.25 |
| (4) | 4 200 | 140.00 |
| (5) | 4 200 | 210.00 |

(……)

**30.** අනෙකුත් සාධක ස්ථාවර ව තිබිය දී ව්‍යාපෘතියක ශුද්ධ වර්තමාන අගය **වැඩිවීමට** පහත කුමන දෑ හේතු වේ ද?

A - අපේක්ෂිත මුදල් ගලාඒම් වැඩි වීම
B - ආරම්භක ආයෝජනයේ පිරිවැය අඩු වීම
C - වත්කමේ සුන්බුන් අගය වැඩි වීම
D - අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය වැඩි වීම

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා D පමණි.
(4) A, B හා C පමණි. (5) A, B, C හා D යන සියල්ලම. (......)

- **ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු තිත් ඉර මත ලියන්න.**

**31.** පහත කාර්යන් කළමනාකරණ ගිණුම්කරණයේ විෂයපථය තුළට ඇතුළත් වන්නේ ද යන්න සඳහන් කරන්න.

| **කාර්යය** | **ඔව්/නැත** |
|---|---|
| A - භාණ්ඩ මිල කිරීම සඳහා පිරිවැය තොරතුරු සැපයීම | :...................... |
| B - පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම | :...................... |
| C - දිගුකාලීන ආයෝජන ව්‍යාපෘති ඇගයීම | :...................... |
| D - ගිණුම්කරණ අනුපාත මත ආයතනයක ලාභදායීත්වය විශ්ලේෂණය කිරීම | :...................... |

**32.** රු. 1 000 000 ක් ප්‍රාග්ධනය ලෙස ආයෝජනය කරමින් 2016.01.01 දින විශ්ව විසින් වෙළෙඳ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. ඔහු මෙම මුදලෙන් 90% ක් භාණ්ඩ මිල දී ගැනීමට වැය කළ අතර, ඒවා පිරිවැය මත 30% ක ලාභ ආන්තිකයක් සහිත ව විකුණන ලදී. 2016.03.31 දිනට ව්‍යාපාරයේ ශුද්ධ වත්කම් රු. 1 200 000 ක් විය. කාලච්ඡේදය තුළ දී අමතර ප්‍රාග්ධනය හඳුන්වා දී හෝ ගැනිලි සිදු කර නොමැත.

2016.03.31 දිනෙන් අවසන් කාලච්ඡේදය සඳහා පහත දෑ ගණනය කරන්න.

(අ) ලාභය රු. ...................... (ආ) මෙහෙයුම් වියදම් රු. ......................

**33.** 2016.04.01 දින සමන් රු. 100 000 කට භාණ්ඩ ණයට මිල දී ගන්නා ලදී. එදින ම එම භාණ්ඩ රු. 120 000 කට අත්පිට මුදලට විකුණන ලද අතර ඒ සඳහා රු. 5 000 ක විකුණුම් වියදම් දරන ලදී.

පහත ආකෘතිය භාවිත කරමින් ගිණුම්කරණ සමීකරණය තුළ මෙම ගනුදෙනුවල **ශුද්ධ බලපෑම** පෙන්වන්න.

**වත්කම් (රු.)** ................. **= වගකීම් (රු.)** ................. **+ හිමිකම් (රු.)** .................

**34.** නිෂ්පාදන ආයතනයක ණයගැති පාලන ගිණුමේ ශේෂය **වැඩි වීමට**, **අඩු වීමට** හෝ **වෙනස් නොවීමට** පහත ගනුදෙනු හේතු වන්නේ ද යන්න සඳහන් කරන්න.

| **ගනුදෙනුව** | **වැඩිවේ/අඩුවේ/වෙනස් නොවේ** |
|---|---|
| A - භාවිත කරන ලද යන්ත්‍ර ණයට විකිණීම | :........................... |
| B - ණයට විකුණූ භාණ්ඩ ආපසු එවීම | :........................... |
| C - වර්ෂය තුළ දී බොල් ණය කපා හැරීම | :........................... |
| D - වර්ෂය අවසානයේ දී අඩමාණ ණය සඳහා වෙන් කිරීම | :........................... |

**35.** 2016.01.01 දින සමාගමක් විසින් ලැයිස්තුගත මිල රු. 500 000 ක් වූ යන්ත්‍රයක් මිල දී ගන්නා ලදී. සැපයුම්කරු ගැනුම් මිල මත 10% ක වෙළෙඳ වට්ටමක් සහ ගෙවිය යුතු මුදල දින 30 ක් තුළ පියවුවහොත් 5% ක මුදල් වට්ටමක් දීමට එකඟ වී ඇත. සමාගම දින 30 තුළ දී ගෙවිය යුතු වටිනාකම පියවන ලදී.

පහත දෑ සඳහන් කරන්න:

(අ) යන්ත්‍රය අත්පත් කර ගැනීමේ පිරිවැය රු. :............................

(ආ) 2016.01.31 දිනෙන් අවසන් මාසය සඳහා ලද වට්ටම් සටහන් කිරීමට ජර්නල් සටහන:

.......................................................................................................

.......................................................................................................

**36.** 2016.03.31 දිනට සමාගමක බැංකු ශේෂය රු. 450 000 ක් විය. එය එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය සමග එකඟ නොවී ය. මෙම ශේෂ සැසඳීමේ දී පහත දෑ හෙළිදරව් විය.

- ණයගැතියකු විසින් රු. 80 000 ක චෙක්පතක් බැංකුවේ සෘජුව තැන්පත් කර තිබුණි.
- බැංකුව විසින් කළ ස්ථාවර නියෝග ගෙවීම් රු. 40 000 ක් විය.
- බැංකුවේ තැන්පත් කරන ලද රු. 60 000 ක චෙක්පත අගරු වී ඇත.
- බැංකුවේ තැන්පත් කරන ලද රු. 20 000 ක චෙක්පත මෙතෙක් උපලබ්ධි වී නොමැත.
- රු. 30 000 ක නිකුත් කරන ලද චෙක්පත්, ගෙවීම සඳහා මෙතෙක් ඉදිරිපත් කර නොමැත.

2016.03.31 දිනට පහත දෑ ගණනය කරන්න:

(අ) සංශෝධිත බැංකු ශේෂය රු. .................... (ආ) බැංකු ප්‍රකාශනයේ ශේෂය රු. ......................

**37.** සමාගමක් හා බැඳි පහත එක් එක් අවස්ථාව **වඩාත් හොඳින්** විස්තර කරනුයේ කුමන ගිණුම්කරණ සංකල්පය ද යන්න සඳහන් කරන්න.

| **අවස්ථාව** | **ගිණුම්කරණ සංකල්පය** |
|---|---|
| A - ඉඩමක සාධාරණ අගය වැඩි වුව ද එය අත්පත් කරගත් මිලට වාර්තා කිරීම | :........................ |
| B - යන්ත්‍ර භාවිත කිරීමට අපේක්ෂිත කාලසීමාව තුළ දී ඒවායේ ක්ෂය හඳුනා ගැනීම | :........................ |
| C - ගැනුම් මිල රු. 5 000 ට අඩු සියලු වත්කම්, වියදම් ලෙස හඳුනා ගැනීම | :........................ |
| D - තොග තක්සේරු කිරීම සඳහා පෙර-පිවිසි-පෙර-පිට මිල ක්‍රමය අඛණ්ඩව භාවිත කිරීම | :........................ |

**38.** පහත එක් එක් අයිතමය හඳුනාගනු ලබන්නේ කුමන මූල්‍ය ප්‍රකාශන මූලිකාංගයෙහි ද යන්න සඳහන් කරන්න.

| අයිතමය | මූලිකාංගය |
|---|---|
| A - රඳවාගත් ඉපැයුම් | :............................ |
| B - ලැබිය යුතු පොලී | :............................ |
| C - කාර්යාල උපකරණ විකුණුම් මත අලාභය | :............................ |
| D - වගකීම් සහතික සඳහා ප්‍රතිපාදන | :............................ |

● **ප්‍රශ්න අංක 39 සහ 40 ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

ශක්ති, කල්ප සහ පවන් විසින් ලාභාලාභ පිළිවෙළින් 5:3:2 අනුපාතයට බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරයක් පවත්වා ගෙන ගියහ. 2016.03.31 දින පවන් හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගන්නා ලද අතර, එදිනට කීර්තිනාමය රු. 1 000 000 කට ඇස්තමේන්තු කරන ලදී. පොත්වල කීර්තිනාම ගිණුමක් පවත්වා නොගැනීම හවුල් ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වේ. ලාභාලාභ සමසමව බෙදා ගනිමින් ශක්ති සහ කල්ප විසින් හවුල් ව්‍යාපාරය දිගටම පවත්වා ගන්නා ලදී. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් තුළ සටහන් කරන ලද ගනුදෙනුවල සාරාංශය පහත පරිදි වේ:

| විස්තරය | ශක්ති (රු.'000) | කල්ප (රු.'000) | පවන් (රු.'000) |
|---|---|---|---|
| ලාභ කොටස | 500 | 300 | 200 |
| වේතන | 400 | 400 | 400 |
| ප්‍රාග්ධන පොලී | 300 | 200 | 100 |
| ගැනිලි | (40) | – | (20) |
| ගෙවූ වේතන | (400) | (400) | (400) |

**39.** හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්වල කීර්තිනාමය ගැළපීමට අදාළ ජර්නල් සටහන:

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

**40.** පහත සඳහන් දෑ ගණනය කරන්න:

(අ) 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ලාභය රු. ..............................

(ආ) විසර්ජනය කළ මුළු ලාභය: ශක්තිට රු. ........................ පවන්ට රු. ........................

**41.** LKAS 8 (ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සහ වැරදි) ප්‍රමිතයට අනුව සමාගමකට ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කළ හැකි අවස්ථා **දෙක** සඳහන් කරන්න.

(1) .....................................................................................................

(2) .....................................................................................................

**42.** ගනුදෙනුකරුවන් මිල දී ගන්නා භාණ්ඩ දෝෂ සහිත වූ විට එහි මිල ආපසු ගෙවීම විදුලි උපකරණ විකුණන වෙළෙඳසැලක ප්‍රතිපත්තිය වේ. කෙසේ වුව ද එවැනි නෛතික බැඳීමක් නොමැත. LKAS 37 (ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්) ප්‍රමිතයට අනුව මෙහි දී ප්‍රතිපාදනයක් හඳුනාගැනීමට සම්පූර්ණ කළ යුතු නිර්ණායක **තුන** සඳහන් කරන්න.

(1) .....................................................................................................

(2) .....................................................................................................

(3) .....................................................................................................

**43.** LKAS 17 (කල්බදු) ප්‍රමිතයට අනුව කල්බද්දක්, මූල්‍ය කල්බද්දක් ලෙස වර්ග කිරීමට භාවිත කරන නිර්ණායක **දෙකක්** සඳහන් කරන්න.

(1) .....................................................................................................

(2) .....................................................................................................

**44.** සමාගමක් නව යන්ත්‍රයක් රු. 5 500 000 කට මිල දී ගන්නා ලදී. මෙම මිල දී ගැනීමට අදාළ ව කරන ලද පහත ගෙවීම් LKAS 16 (දේපළ, පිරියත සහ උපකරණ) ප්‍රමිතයට අනුව හඳුනාගනු ලබනුයේ යන්ත්‍රයේ ආරම්භක පිරිවැයෙහි ද, වියදම්වල ද යන්න අදාළ තීරුවෙහි '√' ලකුණක් යොදමින් දක්වන්න.

| අයිතමය | වටිනාකම (රු.'000) | ආරම්භක පිරිවැය | වියදම් |
|---|---|---|---|
| A - යන්ත්‍ර ක්‍රියාකරු පුහුණු කිරීම | 120 | ............... | ............... |
| B - ස්ථාපිත කිරීම සහතික කළ ඉංජිනේරුවරයාගේ ගාස්තුව | 12 | ............... | ............... |
| C - යන්ත්‍රය අත්හදා බැලීම | 220 | ............... | ............... |
| D - උත්සවාකාරයෙන් යන්ත්‍රය විවෘත කිරීම | 150 | ............... | ............... |

**45.** 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සමාගමකට අදාළ වේ.

- වර්ෂය තුළ දී රු. 250 000 ක් පිරිවැය වූ කාර්යාල උපකරණයක් රු. 50 000 ක ලාභයක් සහිතව විකුණන ලදී. විකුණූ දිනට මෙම වත්කමේ සමුච්චිත ක්ෂය රු. 120 000 ක් විය.
- 2015.04.01 දින පිරිවැය රු. 1 500 000 ක් වූ ඉඩමක් රු. 500 000 ක් අතැති මුදලින් ද, ඉතිරිය ඉඩම උකස් කර ලබා ගත් බැංකු ණයකින් ද ගෙවා මිල දී ගන්නා ලදී. 2016.03.31 දින මෙම ණය සඳහා රු. 100 000 ක පොලියක් ගෙවන ලදී.

ඉහත ගනුදෙනු තුළින් පැනනැගුනු මුදල් ප්‍රවාහයන් (වටිනාකම් සහිතව) සහ LKAS 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශනය) ප්‍රමිතයට අනුව මෙම මුදල් ප්‍රවාහයන්ගේ නිසි වර්ගීකරණයන් සඳහන් කරන්න.

| | **මුදල් ප්‍රවාහය** | **වටිනාකම (රු.)** | **වර්ගීකරණය** |
|---|---|---|---|
| A - | ........................................ | ........................................ | ........................................ |
| B - | ........................................ | ........................................ | ........................................ |
| C - | ........................................ | ........................................ | ........................................ |
| D - | ........................................ | ........................................ | ........................................ |

**46.** අනෙකුත් සාධක ස්ථාවරව තිබිය දී පහත එක් එක් අනුපාතයන්ගේ **වැඩි වීම** සමාගමක ද්‍රවශීලතාවය වැඩි දියුණු වීමක් පෙන්නුම් කරන්නේ ද යන්න සඳහන් කරන්න.

| **අනුපාතය** | **ද්‍රවශීලතාවය වැඩි දියුණු වීම (ඔව්/නැත)** |
|---|---|
| A - ණයගැති පිරිවැටුම | :........................ |
| B - ණය එකතු කිරීමේ කාලය | :........................ |
| C - තොග පිරිවැටුම | :........................ |
| D - තොග රඳවාගැනීමේ කාලය | :........................ |

**47.** කමිස නිෂ්පාදනය කරන සමාගමක් විසින් පහත පිරිවැය දරන ලදී. මෙම පිරිවැය අයිතම, විචල්‍ය (V) හෝ ස්ථාවර (F) හෝ ලෙස වර්ග කර, ඒවා නිෂ්පාදිත පිරිවැයට ඇතුළත් වන්නේ ද යන්න දක්වන්න.

| **පිරිවැය** | **V/F** | **නිෂ්පාදිත පිරිවැය (ඔව්/නැත)** |
|---|---|---|
| A - නිපදවන ලද කමිස ප්‍රමාණය මත සේවක වේතන | ............... | ............................ |
| B - කමිසවලට අල්ලනු ලබන බොත්තම්වල පිරිවැය | ............... | ............................ |
| C - කර්මාන්තශාලාව සඳහා රක්ෂණ වාරිකය | ............... | ............................ |
| D - නිෂ්පාදන සුපරීක්ෂකවරුන්ගේ වැටුප් | ............... | ............................ |

**48.** වෙළෙඳ සමාගමක් තොග නිකුත් කිරීම් මිල කිරීම සඳහා භරිත සාමාන්‍ය ක්‍රමය යොදා ගනී. 2016 මාර්තු මාසයේ තොග අයිතමයකට අදාළ තොරතුරු පහත දී ඇත.

| **දිනය** | **විස්තරය** | **ප්‍රමාණය (ඒකක)** | **මිල (රු.)** |
|---|---|---|---|
| 2016.03.01 | ශේෂය | 1 000 | 10 |
| 2016.03.07 | ගැනුම් | 2 000 | 15 |
| 2016.03.14 | ගැනුම් | 4 000 | 11 |
| 2016.03.20 | විකුණුම් | 4 000 | ? |

පහත දෑ ගණනය කරන්න:

(අ) 2016 මාර්තු මාසයේ විකුණුම් පිරිවැය රු. .................. (ආ) 2016.03.31 දිනට තොගය රු. ..................

**49.** සමාගමක් විසින් තනි භාණ්ඩයක් නිෂ්පාදනය කර අලෙවි කරනු ලබයි. පහත තොරතුරු එහි ඒකක 10 000 ක නිෂ්පාදන මට්ටමට අදාළ වේ.

| | |
|---|---|
| ඒකකයක විකුණුම් මිල | රු. 90 |
| ඒකකයක විචල්‍ය පිරිවැය | රු. 60 |
| ස්ථාවර පිරිවැය | රු. 180 000 |

අනෙකුත් සාධක ස්ථාවර ව තිබිය දී වෙළෙඳපොළ වෙනස්වීම් හේතුවෙන් ඒකකයක විකුණුම් මිල සහ විචල්‍ය පිරිවැය පිළිවෙළින් 30% කින් සහ 20% කින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පහත දෑ ගණනය කරන්න:

| **අවස්ථාව** | **සමච්ඡේද ලක්ෂ්‍යය (ඒකක)** | **ආරක්ෂිත ආන්තිකය (ඒකක)** |
|---|---|---|
| (අ) වෙළෙඳපොළ තත්ත්වය වෙනස් වීමට පෙර | ............................ | ............................ |
| (ආ) වෙළෙඳපොළ තත්ත්වය වෙනස් වීමට පසු | ............................ | ............................ |

**50.** සමාගමක් විසින් රු. 2 400 000 කට යන්ත්‍රයක් මිල දී ගැනීමට සලකා බලමින් සිටී. එහි ඵලදායී ජීව කාලය සහ සුන්බුන් අගය පිළිවෙළින් වසර 5 ක් සහ රු. 600 000 ක් වේ. ක්ෂය වෙන්කිරීම සඳහා සරල මාර්ග ක්‍රමය භාවිත කරනු ලබයි. මෙම යන්ත්‍රයෙන් රු. 600 000 ක ශුද්ධ මුදල් ප්‍රවාහයක් සෑම වර්ෂයක දී ම අපේක්ෂා කෙරේ.

පහත දෑ ගණනය කරන්න:

(අ) පිළිගෙවුම් කාලය (වසර) ....................

(ආ) ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය-සාමාන්‍ය ආයෝජනය මත පදනම්ව (%) ........................

* * *

62647

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations. Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

ගිණුම්කරණය II
கணக்கீடு II
Accounting II

**33 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

**උපදෙස් :**

- ※ **පළමුවන** හා **දෙවන** ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න **හයකට** පමණක් පිළිතුරු සපයන්න.
- ※ සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම **අලුත් කඩදාසියකින්** ආරම්භ කරන්න.
- ※ අදාළ පෙරවැඩ, පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.

**1.** ලිපිද්‍රව්‍ය වෙළෙඳාමේ නියුතු සීමිත සුමේධ පොදු සමාගමේ 2016.03.31 දිනට ශේෂ පිරික්සුම පහත දී ඇත. මෙය එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි සමාගමකි.

| **විස්තරය** | **හර (රු. '000)** | **බැර (රු. '000)** |
|---|---|---|
| වැටුප් | 1 000 | |
| කුලී | 540 | |
| විදුලිය | 120 | |
| දුරකථන | 75 | |
| ගැනුම් | 6 000 | |
| VAT ගෙවීම් | 600 | |
| 2015.04.01 දිනට දේපළ, පිරියත සහ උපකරණ | 10 000 | |
| 2015.04.01 දිනට තොගය | 1 200 | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 7 000 | |
| බැංකුවේ ඇති මුදල් | 730 | |
| ප්‍රවර්තන වර්ෂය සඳහා ගෙවන ලද ආදායම් බදු | 535 | |
| විකුණුම් | | 12 000 |
| VAT එකතු කිරීම් | | 1 320 |
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | | 4 000 |
| 2015.04.01 දිනට රඳවාගත් ඉපැයුම් | | 2 327 |
| ප්‍රත්‍යාගණන සංචිත - කාර්යාල උපකරණ | | 600 |
| කල්බදු ණයහිමියෝ | | 2 353 |
| පොදු සංචිත | | 1 200 |
| 2015.04.01 දිනට සමුච්චිත ක්ෂය - දේපළ, පිරියත සහ උපකරණ | | 4 000 |
| | **27 800** | **27 800** |

**අතිරේක තොරතුරු:**

2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර පහත දෑ සඳහා ගැළපීම් කළ යුතු වේ.

(i) වෙළෙඳ නියෝජිතයන්ට විකුණුම් මත ගෙවූ 2% ක කොමිස්, වැටුප් තුළ ඇතුළත් කර ඇත.

(ii) 2016 මාර්තු මාසය සඳහා රු. 15 000 ක විදුලි බිල මෙතෙක් ගෙවා නොමැත.

(iii) 2016 මාර්තු මාසය සඳහා රු. 18 000 ක දුරකථන ගාස්තු කලින් ගෙවා ඇත. කෙසේ වුව ද මාර්තු මාසය සඳහා බිල රු. 8 000 ක් විය.

(iv) අයිතම ක්‍රමය මත සමාගම තොග අගය කරයි. 2016.03.31 දිනට පැවති තොගය, ලිපිද්‍රව්‍ය අයිතම කාණ්ඩ තුනකින් සමන්විත විය. මෙදිනට ඒවායේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය පහත පරිදි විය.

| **කාණ්ඩය** | **පිරිවැය (රු.'000)** | **ශුද්ධ උපලබ්ධි අගය (රු.'000)** |
|---|---|---|
| A | 520 | 600 |
| B | 300 | 250 |
| C | 280 | 300 |

(v) 2016.03.31 දිනට රු. 750 000 ක ශේෂයක් සහිත ණයගැතියකු බුන්වත් වී ඇති බව 2016.04.30 දින ප්‍රකාශයට පත් කරන ලදී. 2016.05.15 දින සමාගමේ අධ්‍යක්ෂකවරු විසින් මූල්‍ය ප්‍රකාශන අනුමත කරන ලදී.

[ දෙවැනි පිටුව බලන්න.

(vi) 2015.04.01 දිනට දේපළ, පිරියත සහ උපකරණ සහ ඒවායේ සමුච්චිත ක්ෂයවල සංයුතිය පහත පරිදි විය.

| **විස්තරය** | **පිරිවැය/වටිනාකම** (රු.'000) | **සමුච්චිත ක්ෂය** (රු.'000) | **ධාරණ වටිනාකම** (රු.'000) |
|---|---|---|---|
| මෝටර් රථ (කල්බදු පදනමට) - පිරිවැයට | 6 000 | 2 400 | 3 600 |
| කාර්යාල උපකරණ - සාධාරණ අගයට | 2 500 | 1 000 | 1 500 |
| ලී බඩු සහ සවි කිරීම් - පිරිවැයට | 1 500 | 600 | 900 |
| **එකතුව** | **10 000** | **4 000** | **6 000** |

සියලු ම වත්කම් (කල්බදු වත්කම් ද ඇතුළුව) 2013.04.01 දින අත්පත් කරගෙන ඇති අතර එදිනට ඒවායේ ඵලදායී ජීව කාලය වසර 5 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. ඒවා සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.

(vii) 2015.04.01 දින ලී බඩු සහ සවිකිරීම්වල ඉතිරි ඵලදායී ජීව කාලය වසර 6 ක් ලෙස සංශෝධනය කරන ලදී. තව ද 2016.03.31 දින කාර්යාල උපකරණ රු. 1 800 000 ක වෙළෙඳපොළ අගයට ප්‍රත්‍යාගණනය කරන ලදී.

(viii) මෝටර් රථ, භාණ්ඩ ප්‍රවාහනය සඳහා භාවිතයට ගන්නා අතර ඒවායේ කල්බදු කාලය වසර 5 කි. වාර්ෂික කල්බදු වාරිකය රු. 1 583 000 කි. ප්‍රවර්තන වර්ෂයේ කල්බදු වාරිකය ගෙවා ඇති අතර එය සම්පූර්ණයෙන්ම කල්බදු ණයහිමි ගිණුමට හර කර ඇත. මෙය සම්බන්ධ ව වෙනත් කිසිදු සටහනක් තබා නොමැත. කල්බදු පොලිය පහත පරිදි වේ.

| **වසර** | **පොලිය (රු.'000)** |
|---|---|
| 2013/14 | 600 |
| 2014/15 | 502 |
| 2015/16 | 394 |
| 2016/17 | 275 |
| 2017/18 | 144 |

(ix) 2016.03.31 දින සමාගම විසින් පොදු සංචිත ප්‍රාග්ධනීත කරමින් කොටසක් රු. 20 බැගින් සාමාන්‍ය කොටස් 40 000 ක් දැනට සිටින කොටස්කරුවන්ට නිකුත් කර ඇත. කෙසේ වුව ද මේ සම්බන්ධයෙන් කිසිදු සටහනක් තබා නොමැත.

(x) ප්‍රවර්තන වර්ෂය සඳහා ආදායම් බද්ද රු. 500 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

**අවශ්‍යවන්නේ:**

LKAS 1 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතයට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත සුමේධ පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළුව):

(1) 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය

(2) 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

(3) 2016.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **(මුළු ලකුණු 20 යි)**

**2.** (අ) ලාභාලාභ සම සමව බෙදා ගන්නා රංග සහ එරංග උපදේශන සේවා සපයන ව්‍යාපාරයක හවුල්කරුවන් වූහ. 2015.04.01 දින උදාර හවුල්කරුවකු ලෙස බඳවා ගන්නා ලදී. සංශෝධනය කරන ලද හවුල් ව්‍යාපාර ගිවිසුම පහත පරිදි වේ.

- රංග, එරංග සහ උදාර පිළිවෙළින් ලාභාලාභ 2:2:1 අනුපාතයට බෙදාගනු ලබයි.
- හවුල් ව්‍යාපාරයේ පොත්වල කීර්තිනාම ගිණුමක් පවත්වා නොගන්නා අතර කීර්තිනාමයට අදාළ සියලු ගැළපීම් හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් සටහන් කරයි.
- හවුල්කරුවන් වර්ෂ අවසාන ප්‍රාග්ධන ශේෂ මත 10% ක වාර්ෂික පොලියකට හිමිකම් ලබයි.
- එරංගට සහ උදාරට රු. 40 000 බැගින් මාසික වේතනයක් හිමි වේ.
- හවුල් ව්‍යාපාරයට ලබා දෙන ණය සඳහා හවුල්කරුවන් වාර්ෂික ව 8% ක පොලියකට හිමිකම් ලබයි.

2016.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම පහත පරිදි විය:

| **විස්තරය** | **හර (රු.'000)** | **බැර (රු.'000)** |
|---|---|---|
| උපදේශන ආදායම් | | 8 600 |
| උපදේශන වියදම් | 3 500 | |
| මෙහෙයුම් වියදම් | 1 200 | |
| එරංගට ගෙවූ වේතන | 480 | |
| 2016.01.01 දින උදාර ලබා දුන් ණය | | 2 000 |
| උදාරට ගෙවූ ණය පොලී | 30 | |
| 2016.03.31 දිනට දේපළ, පිරියත සහ උපකරණ-ධාරණ වටිනාකමට | 6 000 | |
| දේපළ, පිරියත සහ උපකරණ මත ක්ෂය | 1 800 | |
| වෙනත් ආදායම් | | 100 |
| බැංකුවේ ඇති මුදල් | 290 | |
| 2015.04.01 දිනට ප්‍රාග්ධන ගිණුම් :- රංග | | 1 000 |
| - එරංග | | 1 000 |
| 2015.04.01 දිනට ජංගම ගිණුම් :- රංග | | 200 |
| - එරංග | | 100 |
| උදාර රැගෙන ආ මුදල | | 300 |
| | **13 300** | **13 300** |

[තුන්වැනි පිටුව බලන්න.

**අතිරේක තොරතුරු:**

(i) උදාර පහත දැ ප්‍රාග්ධනය ලෙස ගෙන එන ලදී:

| | රු.'000 |
|---|---|
| කාර්යාල උපකරණ | 700 |
| මුදල් | 300 |

කෙසේ වුව ද උදාර ගෙන ආ මුදල පමණක් ගිණුම් පොත්වල සටහන් කර තිබුණි.

(ii) උදාර බඳවා ගන්නා අවස්ථාවේ දී හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 1 800 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී.

(iii) දේපළ, පිරියත සහ උපකරණ පිරිවැය මත වාර්ෂික ව 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.

(iv) 2016.01.01 දින හවුල් ව්‍යාපාරය සේවාදායකයකු වෙත මාසිකව රු. 100 000 ක ගාස්තුවකට උපදේශන සේවා සැපයීම සඳහා ගිවිසුමකට ඇතුළත් විය. මෙදින සේවාදායකයා රු. 500 000 ක් ගෙවූ අතර එය උපදේශන ආදායම් ලෙස සටහන් කර තිබුණි.

(v) 2016.03.31 දින හවුල් ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය සමග එකඟ නොවී ය. පසුව කරන ලද විමර්ශනයේ දී පහත දැ අනාවරණය විය.

- බැංකුවේ සෘජුව තැන්පත් කරන ලද රු. 300 000 ක උපදේශන ආදායමක් ගිණුම් පොත්වල සටහන් කර නොතිබුණි.
- උපදේශන සේවාවක් වෙනුවෙන් රංගගේ බිරිඳගෙන් ලද රු. 50 000 ක චෙක්පතක් බැංකුවේ තැන්පත් කළ නමුත් මෙතෙක් උපලබ්ධි වී නොමැත. මෙය වෙනත් ආදායම් ලෙස සටහන් කර ඇත.
- බාහිර උපදේශකයන්ට නිකුත් කළ රු. 250 000 ක චෙක්පත් ගෙවීමට ඉදිරිපත් කර නොතිබුණි.
- එරංගගේ රු. 50 000 ක නිවාස ණය වාරිකය ස්ථාවර නියෝග මත හවුල් ව්‍යාපාරයේ බැංකු ගිණුමෙන් ගෙවා ඇති මුත් ගිණුම් පොත්වල සටහන් කර නොතිබුණි.

**අවශ්‍යවන්නේ:**

(1) 2016.03.31 දිනට සංශෝධිත මුදල් ශේෂය සහ බැංකු සැසඳුම් ප්‍රකාශනය

(2) 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය (විසර්ජනයන් සහිතව)

(3) 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන සහ ජංගම ගිණුම්

**(ලකුණු 10 යි)**

(ආ) සපත්තු නිෂ්පාදනයේ නියුතු වෙල්වින් සමාගමට නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් සහ නඩත්තු කටයුතු සඳහා වූ සේවා දෙපාර්තමේන්තුවක් ඇත. ඒකක 5 000 ක ක්‍රියාකාරී මට්ටමේ දී ඉදිරි වර්ෂය සඳහා අයවැයගත තොරතුරු පහත පරිදි වේ.

| **විස්තරය** | **එකතුව** | **නිෂ්පාදන දෙපාර්තමේන්තුව A** | **නිෂ්පාදන දෙපාර්තමේන්තුව B** | **නඩත්තු දෙපාර්තමේන්තුව** |
|---|---|---|---|---|
| වක්‍ර වැටුප් (රු.) | 75 000 | 46 000 | 13 000 | 16 000 |
| යන්ත්‍ර ක්ෂය (රු.) | 30 000 | 20 000 | 10 000 | – |
| කුලී (රු.) | 90 000 | ? | ? | ? |
| ආරක්ෂක ගාස්තු (රු.) | 45 000 | ? | ? | ? |
| විදුලිය (රු.) | 80 000 | ? | ? | ? |
| යන්ත්‍ර පැය | 15 000 | 10 000 | 5 000 | – |
| ශ්‍රම පැය | 14 000 | 2 000 | 12 000 | – |
| භූමි ප්‍රමාණය (වර්ග මීටර) | 9 000 | 3 800 | 3 600 | 1 600 |
| ආරක්ෂක සේවකයන් සංඛ්‍යාව | 15 | 7 | 7 | 1 |
| කිලෝවොට් පැය | 1 600 | 1 000 | 500 | 100 |

**අතිරේක තොරතුරු:**

(i) නඩත්තු දෙපාර්තමේන්තුවේ මුළු පොදු කාර්ය පිරිවැය, නිෂ්පාදන දෙපාර්තමේන්තු **A** සහ **B** අතර පිළිවෙළින් 5:3 අනුපාතයට විභජනය කළ යුතු ය.

(ii) **A** නිෂ්පාදන දෙපාර්තමේන්තුව යන්ත්‍ර පැය ද, **B** නිෂ්පාදන දෙපාර්තමේන්තුව ශ්‍රම පැය ද පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය සඳහා යොදා ගැනේ.

(iii) සපත්තු යුගලයක් නිෂ්පාදනය කිරීම සඳහා නිෂ්පාදන දෙපාර්තමේන්තු **A** සහ **B** හි පිළිවෙළින් පැය 5 ක් සහ පැය 3 ක් ගත කරයි.

(iv) එක් සපත්තු යුගලයක් නිෂ්පාදනය කිරීම සඳහා සෘජු පිරිවැය:

| | | |
|---|---|---|
| අමුද්‍රව්‍ය | යුගලයකට | රු. 30 |
| ශ්‍රමය | යුගලයකට | රු. 20 |

(v) නිෂ්පාදන නොවන පොදු කාර්ය පිරිවැය:

| | | |
|---|---|---|
| විචල්‍ය | යුගලයකට | රු. 25 |
| ස්ථාවර | | රු. 105 000 |

More Past Papers at
tamilguru.lk

[හතරවැනි පිටුව බලන්න.

**අවශ්‍යවන්නේ:**

(1) විභජන පදනම නම් කරමින් පොදු කාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව
(2) එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුව සඳහා පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත
(3) සපත්තු යුගලයක නිෂ්පාදන පිරිවැය
(4) ක්‍රියාකාරී මට්ටම ඒකක 5 000 දී මුළු පිරිවැය

**(ලකුණු 10 යි)**

**(මුළු ලකුණු 20 යි)**

3. සමන් සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබයි. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කෙටුම්පත් ආදායම් ප්‍රකාශනයේ රු. 600 000 ක ලාභයක් වාර්තා කරන ලදී. 2016.03.31 දිනට කෙටුම්පත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු. 50 000 ක මුදල් ශේෂයක් පෙන්වන ලදී. කෙසේ වුව ද ඔහු ගිණුම් පොත් නිසියාකාරව පවත්වා නොගනී. පහත ගනුදෙනු ගිණුම් පොත්වල වාර්තා කර නොමැති බව පසුව හෙළිදරව් විය.

| අංකය | ගනුදෙනුව |
|---|---|
| 1 | රු. 80 000 කට භාණ්ඩ ණයට විකිණීම. මෙම භාණ්ඩවල පිරිවැය රු. 60 000 ක් විය. |
| 2 | රු. 36 000 කට ණයට විකුණූ භාණ්ඩ ආපසු එවීම. මෙම භාණ්ඩවල පිරිවැය රු. 30 000 ක් විය. |
| 3 | පිරිවැය රු. 10 000 ක් වූ භාණ්ඩ පරිත්‍යාග කිරීම. |
| 4 | ව්‍යාපාරයේ නඩත්තු වියදම් රු. 10 000 ක් විය. මෙයින් රු. 6 000 ක් සමන් විසින් පුද්ගලික ව ගෙවන ලද අතර ඉතිරිය ව්‍යාපාරය විසින් ගෙවන ලදී. |
| 5 | 2015.07.01 දින 12% ක වාර්ෂික පොලියට රු. 300 000 ක බැංකු ණයක් ලබා ගැනීම. පොලිය මෙතෙක් ගෙවා නොමැත. |
| 6 | 2016.03.31 දින රු. 280 000 ක අත්පිට මුදලට ත්‍රී රෝද රථයක් මිල දී ගැනීම. |
| 7 | ණයගැතියකුගෙන් අය විය යුතු රු. 30 000 ක් ඔහුට ණයහිමියකු ලෙස ගෙවිය යුතු වූ රු. 50 000 කට එරෙහිව හිලව් කිරීම. ඉතිරිය මුදලින් ගෙවන ලදී. |
| 8 | රු. 12 000 ක් සමන්ගේ ජීවිත රක්ෂණ වාරිකය වෙනුවෙන් ගෙවා ඇත. |
| 9 | ගනුදෙනු අංක 1ට අදාළ ව ලැබිය යුතු මුදල 5% ක වට්ටමක් අඩු කිරීමෙන් පසු ලැබීම. |
| 10 | පෙර වර්ෂයක දී බොල් ණය ලෙස කපා හල රු. 15 000 ක් ලැබීම. |

**අවශ්‍යවන්නේ:**

(1) මෙම ගනුදෙනුවල බලපෑම (අගයන් සහිතව) ගිණුම්කරණ සමීකරණය භාවිත කරමින් පෙන්නුම් කර, එක් එක් අගය ඉදිරියෙන් එය වැඩි වේ නම් (+) ද, අඩු වේ නම් (–) ද යන්න සඳහන් කරන්න. (පහත දී ඇති ආකෘතියට සමාන ආකෘතියක් භාවිත කරන්න).

**රු.'000**

| ගනුදෙනු අංකය | වත්කම් | | | | වගකීම් | | | හිමිකම |
|---|---|---|---|---|---|---|---|---|
| | දේපළ, පිරියත සහ උපකරණ | තොග | වෙළෙඳ ලැබිය යුතු දෑ | මුදල් | දිගුකාලීන ණය | වෙළෙඳ ගෙවිය යුතු දෑ | වෙනත් ගෙවිය යුතු දෑ | |
| | | | | | | | | |

(2) 2016.03.31 දිනට සංශෝධිත මුදල් ශේෂය
(3) 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංශෝධිත ලාභය (හිමිකම මත ගනුදෙනුවල ශුද්ධ බලපෑම පදනම්ව)

**(මුළු ලකුණු 15 යි)**

4. දිමුතු ඔහුගේ පුද්ගලික ඉතුරුම්වලින් රු. 900 000 ක් ආයෝජනය කරමින් 2016.04.01 දින නිෂ්පාදන ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. 2016 අප්‍රේල් මාසය තුළ දී සිදු කරන ලද ගනුදෙනුවල සාරාංශය පහත දී ඇත.

(i) මුදල් ලැබීම් සහ ගෙවීම් ජර්නල්වල සටහන් කළ ගනුදෙනුවල සාරාංශය:

| | රු.'000 |
|---|---|
| **ලැබීම්:** | |
| විකුණුම් | 6 000 |
| ණයගැතියන්ගෙන් ලැබීම් | 2 000 |
| **ගෙවීම්:** | |
| අමුද්‍රව්‍ය ගැනුම් | 1 200 |
| ණයහිමියන්ට ගෙවීම් | 800 |
| අමුද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා ගෙවූ අත්තිකාරම් | 300 |
| යන්ත්‍ර ක්‍රියාකරුවන්ගේ වේතන | 400 |
| නිෂ්පාදන සුපරීක්ෂකවරුන්ගේ වැටුප් | 700 |
| කර්මාන්තශාලා විදුලිය | 60 |
| කර්මාන්තශාලා කුලී | 600 |
| පරිපාලන වියදම් | 200 |
| යන්ත්‍රයක් මිල දී ගැනීම (2016.04.01 දින) | 4 000 |

(ii) අනෙකුත් මූලික සටහන් පොත්වල එකතුන්:

| | රු.'000 |
|---|---|
| විකුණුම් ජර්නලය | 12 000 |
| ගැනුම් ජර්නලය | 8 000 |
| ආපසු එවුම් ජර්නලය | 500 |

(iii) අමුද්‍රව්‍ය මිල දී ගැනීම වෙනුවෙන් ගෙවූ අත්තිකාරම සඳහා, රු. 100 000 ක් වටිනා අමුද්‍රව්‍ය පමණක් 2016.04.27 දින ලැබුණි. මෙය මෙතෙක් ගිණුම් පොත්වල සටහන් කර නොමැත.

(iv) ණයගැතියන්ගෙන් ලැබිය යුතු රු. 300 000 ක් අයකර ගත නොහැකි අතර එය බොල්ණය ලෙස කපා හැරිය යුතු වේ.

(v) මාසික කර්මාන්තශාලා කුලිය රු. 200 000 ක් වන අතර පළමු කාර්තුව සඳහා කුලී ගෙවා ඇත.

(vi) 2016 අප්‍රේල් මාසය සඳහා රු. 50 000 ක් වූ විදුලි බිල 2016.05.10 දින ලැබී ඇත.

(vii) යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය වසර 10 ක් වන අතර සුන්බුන් අගය රු. 400 000 කි. යන්ත්‍ර, සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.

(viii) මාසය අවසානයේ දී තොග ශේෂයන් පහත පරිදි විය:

| | රු.'000 |
|---|---|
| අමුද්‍රව්‍ය | 300 |
| නොනිමි ද්‍රව්‍ය (නිෂ්පාදන පිරිවැයට අගය කළ) | 80 |
| නිමි භාණ්ඩ | 100 |

**අවශ්‍යවන්නේ:**

(1) 2016 අප්‍රේල් මාසය සඳහා පොදු ලෙජරයේ පහත ගිණුම් (T ආකෘතිය භාවිත කරමින්):
   (i) විකුණුම්
   (ii) ණයගැති පාලන
   (iii) අමුද්‍රව්‍ය ගැනුම්
   (iv) ණයහිමි පාලන
   (v) අත්තිකාරම් ගෙවීම්

(2) 2016 අප්‍රේල් මාසය සඳහා නිෂ්පාදන ගිණුම

(3) 2016 අප්‍රේල් මාසය සඳහා ආදායම් ප්‍රකාශනය

(4) 2016.04.30 දිනට පහත අයිතමවල අගයන්:
   (i) දේපළ, පිරියත සහ උපකරණ
   (ii) ඉදිරියට ගෙවූ වියදම්
   (iii) හිමිකම්

**(මුළු ලකුණු 15 යි)**

5. (අ) නිෂ්පාදන සමාගමක් එහි මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා දැනට පවතින යන්ත්‍රය වෙනුවට නව යන්ත්‍රයක් මිල දී ගැනීමට සලකා බලමින් සිටී. නව යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය වසර 5 කි. පහත ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහයන් මෙම යන්ත්‍ර දෙක හා බැඳේ.

| විස්තරය | නව යන්ත්‍රය (රු.'000) | දැනට පවතින යන්ත්‍රය (රු.'000) |
|---|---|---|
| පිරිවැය | 1 000 | – |
| වර්තමාන වෙළෙඳපළ වටිනාකම | – | 300 |
| සුන්බුන් වටිනාකම | 200 | – |
| වාර්ෂික මෙහෙයුම් පිරිවැය: | | |
| වර්ෂය 1 | 100 | 300 |
| වර්ෂය 2 | 100 | 300 |
| වර්ෂය 3 | 120 | 320 |
| වර්ෂය 4 | 120 | 320 |
| වර්ෂය 5 | 140 | 360 |

නව යන්ත්‍රය මිල දී ගන්නේ නම් ව්‍යාපෘතිය ආරම්භයේ දී රු. 280 000 ක අතිරේක කාරක ප්‍රාග්ධනයක් අවශ්‍ය වන අතර එය ව්‍යාපෘතිය අවසානයේ දී නැවත ලබා ගත හැකි ය. ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය 10% කි.

10% වට්ටම් සාධක (දශමස්ථාන දෙකකට) පහත පරිදි වේ :

| වර්ෂය | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| වට්ටම් සාධකය | 0.91 | 0.83 | 0.75 | 0.68 | 0.62 |

**අවශ්‍යවන්නේ:**

(1) මෙම ව්‍යාපෘතියේ මුදල් ගලායාම් සහ ගලාඒම් ඇතුළත් ලේඛනයක්

(2) ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය

(3) ශුද්ධ වර්තමාන අගය මත පදනම් ව ව්‍යාපෘතිය තෝරාගැනීම පිළිබඳ නිර්දේශය **(ලකුණු 05 යි)**

[හයවැනි පිටුව බලන්න.

(ආ) පාසලක ගුරුවරුන්ගේ සුභසාධක සංගමයක් එහි සාමාජිකයින් සඳහා සුහද හමුවක් සංවිධානය කරමින් සිටී. මෙම සංගමයේ සාමාජිකත්වය දැනට සේවයෙහි නියුතු ගුරුවරුන් 120 කින් සහ විශ්‍රාමික ගුරුවරුන් 30 කින් සමන්විත වේ. මෙම හමුව සඳහා පහත වියදම් ඇස්තමේන්තු කර ඇත.

| | | රු. |
|---|---|---|
| සංග්‍රහ වියදම් | එක් සාමාජිකයකුට | 1 100 |
| සමරු කලාපය | එක් සාමාජිකයකුට | 225 |
| තෑගි පාර්සලය | එක් සාමාජිකයකුට | 775 |
| හෝටල් ගාස්තු | | 35 000 |
| ශාලා සැරසිලි | | 5 000 |
| ශබ්ද විකාශන යන්ත්‍ර කුලී | | 2 000 |
| හමුව සංවිධානය කිරීමේ වියදම් | | 3 000 |

විශ්‍රාමික ගුරුවරුන් ද ඇතුළුව සහභාගී වන සියලු ගුරුවරුන්ට ප්‍රවේශ පත්‍ර අලෙවි කිරීමට සංගමය බලාපොරොත්තු වේ. ප්‍රවේශ පත්‍රයක් රු. 3 000 කට මිල කර ඇත. අතිරික්ත මුදල් පුණ්‍ය කටයුත්තක් සඳහා යොදවනු ඇත.

**අවශ්‍යවන්නේ:**

සුහද හමුවට අදාළ ව පහත දෑ ගණනය කරන්න:

(1) එක් ගුරුවරයකු මත දායකය

(2) මුළු පිරිවැය ආවරණය කිරීමට සහභාගී විය යුතු ගුරුවරු සංඛ්‍යාව

(3) සියලු ම ගුරුවරුන් සහභාගී වන්නේ නම්, පුණ්‍ය කටයුත්ත සඳහා පරිත්‍යාග කළ හැකි මුදල

(4) රු. 27 000 ක් පුණ්‍ය කටයුතු සඳහා පරිත්‍යාග කිරීම පිණිස සහභාගී විය යුතු ගුරුවරු සංඛ්‍යාව

(5) සියලු ම ගුරුවරුන් සහභාගී වන්නේ නම්, ප්‍රවේශ පත්‍රයක් විකිණිය හැකි අවම මිල

(6) විශ්‍රාමික ගුරුවරුන්ට ප්‍රවේශ පත්‍ර මිල දී ගැනීම අවශ්‍ය නොවන්නේ නම් සහ ඔවුන්ගෙන් 24 දෙනෙකු පැමිණීම අපේක්ෂා කරන්නේ නම්, මුළු පිරිවැය ආවරණය කිරීම සඳහා විකිණිය යුතු ප්‍රවේශපත්‍ර සංඛ්‍යාව

**(ලකුණු 10 යි)**

**(මුළු ලකුණු 15 යි)**

6. (අ) 2016.03.01 දින ස්ථාපිත කරන ලද මිගාර අධ්‍යාපන ආයතනය පාසල් හැර යන්නන් සඳහා ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලා පවත්වනු ලබයි. ආයතනයෙහි ස්ථිර ගුරුවරුන් දෙදෙනෙකු සහ තාවකාලික ගුරුවරයකු සේවයේ යොදවා ඇත. එක් ගුරුවරයකු මසකට පැය 120 ක් ඉගැන්විය යුතු ය.

(i) ගුරුවරුන්ගේ දළ වැටුප පහත අයිතමයන්ගෙන් සමන්විත වේ:

- ඉගැන්වීම සඳහා ගෙවීම් (පැය 120 සඳහා):

| | | |
|---|---|---|
| ස්ථිර-එක් ගුරුවරයකුට | මාසිකව | රු. 75 000 |
| තාවකාලික | පැයකට | රු. 500 |

- අතිරේක සැසි පැවැත්වීම සඳහා ගෙවීම් — පැයකට රු. 750
- පිළිතුරුපත්‍ර ලකුණු කිරීමේ ගාස්තු — පත්‍රයකට රු. 100

(ii) 2016 මාර්තු මාසය සඳහා ඉගැන්වූ පැය ගණන සහ ලකුණු කළ පිළිතුරුපත් සංඛ්‍යාව පහත පරිදි වේ.

| **විස්තරය** | **ස්ථිර:** | | **තාවකාලික:** |
|---|---|---|---|
| | **නන්දනී** | **සුරේෂ්** | **මංජුල** |
| මාසය තුළ වැඩ කළ පැය ගණන | 140 | 160 | 180 |
| ලකුණු කළ පිළිතුරුපත් සංඛ්‍යාව | 100 | 150 | 200 |

(iii) සේවක අර්ථසාධක අරමුදල් (EPF) සහ සේවක භාරකාර අරමුදල් (ETF) දායකත්වයන්, ස්ථිර මෙන් ම තාවකාලික ගුරුවරුන්ගේ දළ වැටුප මත පදනම් වේ. සේවායා සහ සේවක EPF දායකත්වයන් පිළිවෙළින් 15% ක් සහ 10% ක් වේ. ETF සඳහා සේව්‍යයාගේ දායකත්වය 3% ක් වේ.

**අවශ්‍යවන්නේ:**

2016 මාර්තු මාසය සඳහා:

(1) වැටුප් ලේඛනය

(2) වැටුප් පාලන ගිණුම

**(ලකුණු 05 යි)**

More Past Papers at
tamilguru.lk

[හත්වැනි පිටුව බලන්න.

(ආ) 2013.04.01 දින පාසලක ආදි ශිෂ්‍යාවන්ගේ සංගමයක් ස්ථාපිත කරන ලදී. එහි ආරම්භක සාමාජිකාවන් රු. 500 000 ක් දායක වෙමින් යාවජීව සාමාජිකයින් ලෙස බැඳුනි. මෙම සංගමයේ පොත්වලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

| විස්තරය | 2016.03.31 දිනට (රු.'000) | 2015.03.31 දිනට (රු.'000) |
|---|---|---|
| ලැබිය යුතු සාමාජික මුදල් | 20 | 15 |
| කලින් ලද සාමාජික මුදල් | 30 | 25 |
| සමුච්චිත අරමුදල | ? | 200 |
| යාවජීව සාමාජික අරමුදල | ? | 400 |
| ටී ෂර්ට් තොගය - පිරිවැයට | 40 | - |
| ශාලාව වෙන්කිරීමේ අත්තිකාරම | - | 25 |
| සංගීත ප්‍රසංගයෙන් ලැබිය යුතු දෑ | ? | - |
| මුදල් | ? | 50 |

**අතිරේක තොරතුරු:**

(i) එක් අයෙකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 500 කි. 2016.03.31 දිනට සාමාජිකයන් 600 දෙනෙකු (යාවජීව සාමාජිකයින් හැර) විය.

(ii) යාවජීව සාමාජික මුදල වසර 10 ක කාලයක් තුළ ආදායමෙහි හඳුනා ගැනේ.

(iii) සංගමයට අරමුදල් රැස් කිරීම සඳහා 2015.10.01 දින පවත්වන ලද සංගීත ප්‍රසංගයට පහත තොරතුරු අදාළ වේ:

| විස්තරය | මුදල් ලැබීම්/ගෙවීම් (රු.'000) |
|---|---|
| ප්‍රවේශ පත්‍ර විකුණුම්: | |
| එකක් රු. 1 000 බැගින් වන ප්‍රවේශ පත්‍ර 100 ක් | 100 |
| එකක් රු. 500 බැගින් වන ප්‍රවේශ පත්‍ර 400 ක් (80% ක් පමණක් ලැබුණි) | 160 |
| ප්‍රසංගය සඳහා අනුග්‍රාහක දායකත්වයන් (75% පමණක් එකතු කර ඇත) | 375 |
| සංගීතඥයින්ට ගෙවීම්: | |
| එක් අයෙකුට රු. 40 000 බැගින් ගායකයින් 5 දෙනෙකුට | 200 |
| සංගීත කණ්ඩායමට | 80 |
| ශාලා කුලිය | 50 |
| සංග්‍රහ වියදම් | 30 |

(iv) සංගමය විසින් එකක් රු. 200 බැගින් ටී ෂර්ට් 500 ක් අත්පිට මුදලට මිලට ගන්නා ලදී. මෙයින් 300 ක්, එකක් රු. 250 බැගින් සාමාජිකයින් අතරේ අත්පිට මුදලට විකුණන ලදී.

(v) පරිපාලන සහායකට රු. 30 000 ක මාසික වැටුපක් ගෙවනු ලැබේ.

**අවශ්‍යවන්නේ:**

(1) 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ගිණුම

(2) 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත දෑ:
   (i) සාමාජික මුදල් ආදායම
   (ii) සංගීත ප්‍රසංගයේ අතිරික්තය/හිඟය
   (iii) ටී-ෂර්ට් විකිණීමෙන් ලද අතිරික්තය/හිඟය

(3) 2016.03.31 දිනට පහත අයිතමවල ශේෂයන්:
   (i) සමුච්චිත අරමුදල
   (ii) යාවජීව සාමාජික අරමුදල
   (iii) සංගීත ප්‍රසංගයෙන් ලැබිය යුතු දෑ

**(ලකුණු 10 යි)**

**(මුළු ලකුණු 15 යි)**

7. (අ) 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සීමිත උපුල් පොදු සමාගම හා බැඳේ.

| | |
|---|---|
| දළ ලාභ අනුපාතය | 20% |
| වත්කම් පිරිවැටුම් අනුපාතය | වාර 0.5 |
| තොග පිරිවැටුම් අනුපාතය | වාර 8 |
| දළ ලාභය | රු. 400 000 |
| මුළු වියදම් | රු. 160 000 |
| 2016.03.31 දිනට මුළු වගකීම් | රු. 1 600 000 |

**අවශ්‍යවන්නේ:**

(1) 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම්

(2) 2015/16 වර්ෂය සඳහා සාමාන්‍ය තොගය

(3) 2016.03.31 දිනට මුළු වත්කම්

(4) හිමිකම මත ඉපැයුම් අනුපාතය

(5) හිමිකම් අනුපාතය

**(ලකුණු 05 යි)**

[අටවැනි පිටුව බලන්න.

(ආ) 2016.03.31 සහ 2015.03.31 දිනයන්ට සීමිත නායගම් පොදු සමාගමේ සාරාංශගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත දී ඇත.

| **විස්තරය** | **2016.03.31 දිනට (රු.'000)** | **2015.03.31 දිනට (රු.'000)** |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ-ප්‍රත්‍යාගණන වටිනාකමට ............ | 312 | 240 |
| සමුච්චිත ක්ෂය - දේපළ, පිරියත සහ උපකරණ ................... | (72) | (40) |
| තොගය ............................................................ | 184 | 104 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ ............................................ | 80 | 120 |
| අඩමාන ණය සඳහා වෙන් කිරීම් ................................ | (32) | (16) |
| මුදල් ............................................................ | 192 | – |
| **මුළු වත්කම්** ................................................ | **664** | **408** |
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය................................ | 280 | 40 |
| ප්‍රත්‍යාගණන සංචිත .............................................. | 56 | 16 |
| රඳවාගත් ඉපැයුම් ................................................ | 32 | 96 |
| දිගුකාලීන ණය .................................................. | 120 | – |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ ........................................... | 136 | 144 |
| ගෙවිය යුතු වැටුප් ............................................... | 40 | 32 |
| බැංකු අයිරාව .................................................. | – | 80 |
| **මුළු වගකීම් සහ හිමිකම්** ..................................... | **664** | **408** |

**අතිරේක තොරතුරු:**

(i) 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ සාරාංශගත ආදායම් ප්‍රකාශනය පහත පරිදි වේ.

| **විස්තරය** | **රු.'000** |
|---|---|
| විකුණුම් ............................................................ | 120 |
| විකුණුම් පිරිවැය .................................................. | (80) |
| කොමිස් ආදායම (වර්ෂය අවසානයේ ලැබිය යුතු දෑ නොමැත.) ............ | 8 |
| ලී බඩු විකිණීම මත ලාභය (එහි ධාරණ වටිනාකම රු. 40 000 ක් විය.) ... | 16 |
| අඩමාණ ණය ........................................................ | (16) |
| ක්ෂය ............................................................... | (40) |
| වැටුප් ............................................................. | (72) |
| වර්ෂයේ අලාභය ................................................... | (64) |

(ii) වර්ෂය තුළ දී දේපළ, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය කර ඇත. වර්ෂය තුළ දේපළ, පිරියත හා උපකරණ මිල දී ගැනීම් අත්පිට මුදලට සිදු කර ඇත.

(iii) වර්ෂය තුළ දී කොටස් නිකුතුවක් සිදු කර ඇති අතර 2016.03.31 දින වසර 3 ක කාලයක් සඳහා ණයක් ලබා ගෙන ඇත.

**අවශ්‍යවන්නේ:**

LKAS 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශනය) ප්‍රමිතයට අනුව 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත නායගම් පොදු සමාගමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

**(ලකුණු 10 යි)**
**(මුළු ලකුණු 15 යි)**

* * *